මහා සභාව
2021-10-14

## වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2021 වර්ෂයේ / 43 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව

### 2021.10.14

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වි .සුසන්ත පෙරේරා මහතා
2. ගරු උප සභාපති ආර්.ඒ .නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම් .කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ් .ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ .ජුඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනි ආර් .නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ .නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම් .ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී ඩබ් .ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රී ඒ .රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී කේ.එල් .චමින්ද කුමාර කරුණානායක මහතා
13. ගරු මන්ත්‍රිනි ජී .ලීනා ප්‍රියන්ගිකා පෙරේරා මහත්මිය
14. ගරු මන්ත්‍රිනි ජේ.කේ .දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය
15. ගරු මන්ත්‍රී කේ .නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
16. ගරු මන්ත්‍රිනි අයි .එච් .නයෝමි රම්‍යලතා මහත්මිය
17. ගරු මන්ත්‍රී එල් .දිනේෂ් චන්දන පෙරේරා මහතා
18. ගරු මන්ත්‍රී ඩබ්.ඒ .රෙන්ෆ්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා
19. ගරු මන්ත්‍රී ආර්.පි .අකිල ශිරංග රාජපක්ෂ මහතා
20. ගරු මන්ත්‍රී ඩී.එල් .අමල් සුරංග මහතා
21. ගරු මන්ත්‍රී ඩබ් .ස්ටැන්ලි තිසේරා මහතා
22. ගරු මන්ත්‍රී ජී.කේ .අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී එච්.ඒ .ක්ලීටස් පෝල් පෙරේරා මහතා
24. ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා
25. ගරු මන්ත්‍රී එම් .ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා
26. ගරු මන්ත්‍රී බි .ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා

27. ගරු මන්ත්‍රී ඩබ් .සුරේන් ඇන්ටන් ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
28. ගරු මන්ත්‍රිනි එච්.එම් .සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය
29. ගරු මන්ත්‍රිනි පි.එම් .ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
30. ගරු මන්ත්‍රිනි එම්.එම්. මේරි වාලට් කුරේ මහත්මිය
31. ගරු මන්ත්‍රිනි ඩබ් .දුලක්ෂි වමෝදරි ප්‍රනාන්දු මෙනවිය
32. ගරු මන්ත්‍රිනි ආර්.පි .නදීකා රණවිර මහත්මිය
33. ගරු මන්ත්‍රී ඩබ්.ඒ .ගෝඨාභය වික්‍රමසිංහ මහතා
34. ගරු මන්ත්‍රිනි ඒ.එම් .චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
35. ගරු මන්ත්‍රී ටි.බි.ඩි .ඇන්ටනි කුමාර් මහතා
36. ගරු මන්ත්‍රී වි.කේ.එම් .අසන්ත කුලසේකර මහතා
37. ගරු මන්ත්‍රී අයි.බී. සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
38. ගරු මන්ත්‍රී එස්.එම් .දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ආදරණීය පියාණන් වූ ගුණසේකර අභයවික්‍රම මහතා අප අතරින් වෙන් වූ බැවින් එතුමා සමාජයට කල සේවාව අගය කරමින් විනාඩියක නිශ්ශබ්දතාවයක් පැවැත්වුණි.

## 01.2021.09.09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**තීරණ අංක 01**

2021.09.09 **වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.**

## 02.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන.

01. අද දින වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ ජන්ම දිනය යෙදී ඇති බවත් තමන් ,ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හා ලේකම්මහතා ඇතුළු වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සියළුම නිලධාරීන් සහ සේවක මහත්මමහත්මීන්ද එතුමාට නිදුක් නිරෝගී වාසනාවන්ත ජන්ම දිනයක් වේවායැයි ප්‍රාර්ථනා කරන බවත් ගරු සභාපතිතුමා පවසමින් එතුමාට සුභ පැතුම් එක් කරන ලදී.

02. වෙන්නප්පුව ප්රාදේශීය සභාවේ ජේෂ්ඨ ගරු මන්ත්රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ආදරණීය පියාණන් වන ගුණසේකර අභයවි ක්‍රම මහතා පසුගිය දිනක අප අතරින් වියෝ වූ බවත්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් සියළුම මන්ත්‍රී මණ්ඩලයේ සහ ලේකම්මහතා ඇතුළු වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සියළුම නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන්ගේ සාතිශය සංවේගයගරු මන්ත්රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඇතුළු පවුලේ සැමට දැනුම් දෙන ලදී.

## 03. නිවාඩු අනුමත කිරීම.

(I) නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 02

ගරු සභාපතිතුමා ඉදිරිපත් කල අදදින මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
- ගරු මන්ත්‍රී ඩබ් .ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා

කොවිඩ්-19 වසංගතය මේ වනවිට කෙමෙන් තුරන් වී යන බැවින් ගරු මන්ත්‍රීවරුන්/වරියන් ගරු මහා සභාවට හෝ කාරක සභා සඳහා නොපැමිණෙන්නේ නම් තමාව හෝ ලේකම්මහතාව දැනුවත් කරන ලෙසත්, එසේත් නොමැති නම් නිවාඩු අනුමත කිරීමක් සිදු නොකරන බවත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන ලෙසද ලේකම්වරයා දැනුවත් කරන ලදී.

(ii) 2021 සැප්තැම්බර් මස කාරක සභා සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

කාරක සභා සඳහා අනිවාර්යෙන්ම සම්බන්ධ විය යුතු බවත්, එය යුතුකමක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.
සමහර රැස්වීම් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් නොදන්නා බව ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

පසුගිය කර්මාන්ත කමිටුව සම්බන්ධයෙන් දැනුම් දීමක් නොකල බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ සම්බන්ධයෙන් සොයා බලන ලෙස ගරු සභාපතිතුමා විසින් ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

තීරණ අංක 03

2021 සැප්තැම්බර් මස පහත සඳහන් **කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**2021 සැප්තැම්බර් මස 06** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **3.** | ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා |
| **4.** | ගරු මන්ත්රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2021 සැප්තැම්බර් මස 15** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **3.** | ගරු මන්ත්රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා |
| **5.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2021 සැප්තැම්බර් මස 21** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **3.** | ගරු මන්ත්රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා |
| **5.** | ගරු මන්ත්රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |

| | |
|---|---|
| 6. | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2021.09.03** වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා |
| 7. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

**2021.09.14** වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව

| | |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| 2. | ගරු මන්ත්‍රී ආර්.පී. අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| 4. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා |
| 5. | ගරු මන්ත්‍රී එස්.එම්. දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා |

**23-09-2021**වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව

| | |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| 5. | ගරු මන්ත්‍රී වී.කේ.එම්. අසන්ත කුලසේකර මහතා |

**2021-09-21** වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව

| | |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා |
| 3. | ගරු මන්ත්‍රී කේ. නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්. සුරේන් ඇන්ටන් ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා |
| 7. | ගරු මන්ත්‍රිනි ආර්.පී. නදීකා රණවීර මහත්මිය |
| 8. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා |

**04.** අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ " සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙල සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මඟින් සක්‍රීය දායකත්වය ලබා දෙමින් සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම සඳහා 2021/10/11 වන දින මුල්ගල තැබීමට හැකි වූ බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු රොෂාන් රණසිංහ මැතිතුමාට එම අවස්ථාවට සහභාගී වීමට නොහැකි වුවද එතුමාගේ ලේකම්තුමා සහභාගී වූ බවත්,එතුමාටද, වැවිලි කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාටද, ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය

අමාත්‍ය ගරු සනත් නිශාන්ත මැතිතුමාටද, වයඹ පළාත් හිටපු ගරු මන්ත්‍රීතුමන්ලාටද එමෙන්ම අප සභාවේ ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රී මණ්ඩලයටද හදපිරි ස්තූතිය පුද කරන ලදී. විශේෂයෙන් පරිසර කමිටු සභාපතිතුමාට සහ ඝණ අපද්‍රව්‍ය කලමනාකරණ නිලධාරී අනුරාධි ජයලත් මහත්මියටද එමෙන්ම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම්මහතා, නිලධාරී මණ්ඩලය ඇතුළු සියළුම සේවක මහත්මමහත්මීන්ටද ස්තූතිය පුද කරන ලදී. තමන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝශන් පෙරේරා මැතිතුමාටද ආරාධනා පත්‍රයක් යැවූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.ගරු මන්ත්‍රීවරුන්ට whatsapp ගිණුම ඔස්සේ ආරාධනා යැවූ බවත්, කමිටු සභාපතිවරුන්ට පමනක් ආරාධනා පත්‍ර ලබා දුන් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම ආරාධනය නොලැබුණ බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ .ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී. whatsapp ගිණුම නිතරම ගරු මන්ත්‍රීවරුන් භාවිතා නොකරන බැවින් දුරකථන ඇමතුම් ලබා දී පණිවිඩය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

05. CAT-2020 වැඩසටහන යටතේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මඟින් පිඹුරුපත් (Bop) අනුමත කිරීම 2020-10-12 වන දින පළාත් පාලන කොමසාරිස්තුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට හැකි වූ බවත්, එම අවස්ථාවට සහභාගී වූ පළාත් පාලන කොමසාරිස්තුමාටද, නියෝජ්‍ය පලාත් පාලන කොමසාරිස්තුමියටද ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම්මහතා ඇතුළු සියළුම නිලධාරී මණ්ඩලයටද ගරු සභාපතිතුමා විසින් ස්තූතිය පුද කරන ලදී. එමෙන්ම නවීන තාක්ෂණයත් සමඟ මේ මස 29 වන දින සිට නිවසේ සිටම මුදල් ගෙවීමට හැකි ක්‍රමවේදයක් (online payment) සකස් කරන බවත්, ඔක්තෝම්බර් මස 29 වන දින පැවැත්වීමට නියමිත එම නිල උත්සවයට සහභාගී වන ලෙස ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කරන ලදී. එම අවස්ථාවට ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාටද ආරාධනා කරන බවත් එතුමන්ලාගේ සහභාගීත්වයෙන් මෙම උත්සවය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙය දවසින් දෙකකින් සිදු වූ කර්තව්‍යයක් නොවන බවත් මේ සඳහා දීර්ඝ ලෙස කැපවීම් කර වසර ගණනක් විශාල පරිශ්‍රමයක් දරා සහ මහජනතාවගේ මුදල්ද යොදවා ලබා ගත් ජයග්‍රහණයක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

06. ප්‍රිමික්ස් අංශය විසින් පසුගිය දිනවල පහත නම් සඳහන් මාර්ග ප්‍රිමික්ස් කල බව දැනුම් දුන් අතර ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා විසින් ස්තූතිය පුද කරන ලදී.

- ගොරකාගස් හංදිය පාර
- මොහොට්ටිමුල්ල ක්ෂේමානන්ද මාවත
- මොහොට්ටිමුල්ල අතුරු මාර්ග
- කම්මල තින්දරි මාවත
- කිරාගාර නිල පියස පාර
- සින්දාත්‍රිය අතුරු මාර්ග
- නයිනමඩම ජූඩ් මාවත
- දුම්මලකොටුව බයිබල් පල්ලිය පාර

- බෝතලේගම කරුණාරත්න මහතාගේ නිවස අසල පාර

07. සෙන්දිරියාමුල්ල ඉඩමෙන් ලබාගත් පොල් ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කල බවත්, රු.30,976.00ක මුදලක් ගිණුම්ගත කර ඇති බවත් දැනුම් දෙන ලදී.

පොල් මුර කීයක පොල් කැඩුවේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

පොල් මුර දෙකක පොල් කඩා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පොල් කඩා මිල ගණනක් නොකැඳවා පොල් විකුණුයේ කෙසේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.එය මුදල් රෙගුලාසි වලට පටහැනි බවත්, එම නීති රෙගුලාසි සම්බන්ධයෙන් ලේකම්තුමා දැනුවත් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. පළමු මුරයේදී පොල් ගෙඩි 800ක් කැඩූ බවත්, පළමු මුරයේදී පොල් කඩා කොම්පෝස්ට් අංගණයට ගෙනා බවත්, තුන්වන මුරයේදී පොල් කැඩූයේ පෝය දිනයේ බවත් ප්‍රකාශ කරන ලදී.

දෙවරක් පමණක් පොල් කඩා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පොල් මුර තුනක් කඩාඇති බවත්,ටෙන්ඩර් කැඳවීමක් නොමැතිව එසේ සිදු කලේ කෙසේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

මෙහි සම්පූර්ණ තොරතුරු සියල්ල ලිපිගොණු වල ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මුදල් රෙගුලාසි යටතේ මිල ගණන් නොකැඳවා පොල් විකිණීය හැකිදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

මේ වන විට අවස්ථා දෙකකදී පොල් කඩා ඇති බවත්,එයින් පොල් ගෙඩි 500ක් තවන් කිරීම සඳහා වෙන් කර ඇති බවත් ඉතිරි පොල් නීත්‍යානුකූල ආකාරයට විකුණා මුදල් සභාවේ ගිණුම් ගත කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් පසුව සාකච්ඡා කරමුයැයිද පවසමින්, එම ඉඩමේ ඉදි කිරීමට යන නව ගොඩනැඟිල්ලේ වැඩ කටයුතු සඳහා සහයෝගය දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

ඩිජිටල් තිරිය ඔස්සේ පසුගිය මස වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රගතිය සියළුම දෙනාට දැක ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 03. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

i. 2020/2019/2018වර්ෂ වල සහ 2021 වර්ෂයේ ජුනි මස දක්වා සභා අරමුදලින් ගෙවා ඇති නීතිඥ ගාස්තු සහ දඩ මුදල් ප්‍රමාණය නොපමණද? යන ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම තොරතුරු සභාගත කරන ලෙසට ඉල්ලා තිබේදැයිද නැතහොත් ගරු මන්ත්‍රීතුමා විසින් එතුමාට ලබා දෙන ලෙසට ඉල්ලා ඇති තොරතුරුදැයිද ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මෙම තොරතුරු ගරු මන්ත්‍රීතුමා විසින් යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ ගරු මහා සභාව වෙත යොමු කර ඇති ප්‍රශ්න බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී 2018/2019/2020 වර්ෂ වල සහ 2021 වර්ෂයේ ජුනි මස දක්වා සභා අරමුදලින් කිසිඳු දඩ මුදලක් ගෙවා නොමැති බවත් පවසමින් 2018/2019/2020 වර්ෂ වල සහ 2021 වර්ෂයේ ජුනි මස දක්වා සභා අරමුදලින් ගෙවා ඇති නීතිඥ ගාස්තු ප්‍රමාණය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- 2018 වර්ෂය - නැත
- 2019 වර්ෂය - රු.833,500.00
- 2020 වර්ෂය - රු.474,500.00
- 2021 වර්ෂය (ජුනි දක්වා)-188,500.00

ii. 2019/2020 වර්ෂ වල පුස්තකාල සඳහා පොත් මිල දී ගැනීමට වැය කල මුදල් ප්‍රමාණය කොමණද? (එක් එක් පුස්තකාලය සඳහා වෙන් වෙන් වශයෙන් ) යන ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල තොරතුරු ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- **2019 වර්ෂය තුළ එක් එක් පුස්තකාලයන් සඳහා මිලදී ගත් පොත් වල වටිනාකම**

| අ.අ | පුස්තකාලයේ නම | මිලදී ගත් පොත් වල වටිනාකම (රු.) |
|---|---|---|
| 01 | කිරිමැටියාන මහජන පුස්තකාලය | 518,303.02 |
| 02 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | 518,171.07 |
| 03 | ලුණුවිල මහජන පුස්තකාලය | 516,589.02 |
| 04 | මහයායවත්ත මහජන පුස්තකාලය | 430,674.27 |
| 05 | සිරිගම්පල මහජන පුස්තකාලය | 326,224.02 |
| 06 | දංකොටුව මහජන පුස්තකාලය | 316,828.02 |
| 07 | කහටවිලවත්ත මහජන පුස්තකාලය | 314,644.02 |

| | | |
|---|---|---|
| 08 | බුජ්ජම්පළ මහජන පුස්තකාලය | 266,254.02 |
| 09 | කම්මල්පත්තුව මහජන පුස්තකාලය | 257,148.02 |
| 10 | ගෝනවිල මහජන පුස්තකාලය | 215,224.02 |
| 11 | ජංගම පුස්තකාලය | 215,164.02 |
| **එකතුව** | | **3,895,223.52** |

➢ **2020 වර්ෂය තුළ එක් එක් පුස්තකාලයන් සඳහා මිලදී ගත් පොත් වල වටිනාකම**

| අ.අ | පුස්තකාලයේ නම | මිලදී ගත් පොත් වල වටිනාකම (රු.) |
|---|---|---|
| 01 | වෙන්නප්පුව මහජන පුස්තකාලය | 17,646.00 |
| 02 | කිරිමැටියාන මහජන පුස්තකාලය | 3,546.00 |
| 03 | ලුණුවිල මහජන පුස්තකාලය | 3,546.00 |
| 04 | කම්මල්පත්තුව මහජන පුස්තකාලය | 3,546.00 |
| 05 | දංකොටුව මහජන පුස්තකාලය | 3,546.00 |
| 06 | කහටවිලවත්ත මහජන පුස්තකාලය | 3,546.00 |
| 07 | ගෝනවිල මහජන පුස්තකාලය | 3,546.00 |
| 08 | මහයායවත්ත මහජන පුස්තකාලය | 3,546.00 |
| 09 | ජංගම පුස්තකාලය | 3,546.00 |
| 10 | සිරිගම්පල මහජන පුස්තකාලය | 3,246.00 |
| 11 | බුජ්ජම්පළ මහජන පුස්තකාලය | 3,246.00 |
| **එකතුව** | | **52,506.00** |

## 04. යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

**i.** වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි හා ක්‍රීඩාංගණ පවත්වාගෙන යාම පිළිබඳව බස්නාහිර පළාත් නීති උපදේශක පාලිත අබේවර්ධන මහතාගේ උපදේශකත්වයෙන් හා පලාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් හා වෙන්නප්පුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහභාගීත්වයෙන් සකස් කරන ලද අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස **අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී. මෙය විශාල ජයග්‍රහණයක් බවත්, වැදගත් කටයුත්තක් බවත්, ඉතිහාසයේ මෙවැනි දෙයක් සිදු වී නොමැති බවත් තවදුරටත් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.**

ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගේ අවසර ගැනීමෙන් පසුව මෙම අතුරු ව්‍යවස්ථාව අප සභාවේ ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය වෙනුවෙන්ම නිර්මාණය කරන ලද්දක් බව ප්‍රකාශ කරන ලදී.අප සතු අතුරු ව්‍යවස්ථා සීමිත බවත් මෙම දුර කාලය තුළ මෙලෙස අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමට හැකි වීම අප ලද භාග්‍යයක් ලෙස සැලකිය හැකි බවත් ප්‍රකාශ

කරන ලදී. යම් යම් සංශෝධන තිබිය හැකි බවත් එම සංශෝධනද මෙයට ඇතුළත් කිරීමට හැකියාවක් තිබෙන බවත් මෙම කාලය තුළ වයඹ අභිමානය වන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට කීර්තියක් ගෙන දීමට මෙම ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය ප්‍රමුඛත්වය ගත් බවත් එහි කටයුතු තවදුරටත් විධිමත් කිරීමට මෙම අතුරු ව්‍යවස්ථාවක් අවශ්‍ය වන බැවින් මෙම අතුරු ව්‍යවස්ථාව සම්මත කර දෙන ලෙසට ගරු සභාවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහාතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමනේ පසුව මෙම අතුරු ව්‍යවස්ථාව සකස් කිරීම ඉතාමත් හොඳ කටයුත්තක් බවත්, නමුත් මෙය කියවීමටවත් වේලාවක් නොලැබුණ බවත්, මහා සභා වාර්තාව තමා අතට පත් වූයේ සඳුදා දින දහවල් බවත් ප්‍රකාශ කරන ලදී. සභා වාර්තාව පරිශීලනය කිරීමට කාලය ප්‍රමාණවත් නොවූ බැවින් මෙම අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කිසිදු අදහසක් නොමැති බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සංශෝධන තිබේනම් කතා කර ඇතුළත් කර ගනිමුයැයිද, මෙය අනුමත කරගනිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 04

1952 අංක 06 දරණ පලාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වගන්තිය සමඟ කියවියයුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සහ එකී පනතේ 126 ( xiv) වන වගන්තියෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා පිටි සහ සභාවේ ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයෙහි කටයුතු නියාමනය කිරීම සම්බන්ධයෙන් සභාව විසින් සකස් කර මෙහි උපලේඛණයක් ලෙස දක්වා ඇති වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩාපිටි හා ක්‍රීඩාංගණ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභාවේ අතුරු ව්‍යවස්ථාවක් ලෙස පිළිගැනීමටත්, ඒ සඳහා වයඹ පලාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

**ii.** නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී පීඩාර ලබා දීම සඳහා ගරු මසිරි මහතාට වෛද්‍යඅනිල් ප්‍රේ.එල්. මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම පිණිස **අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මේ සම්බන්ධයෙන් ගැටළුවක් තිබෙන බවත්, කමිටුවට දමා කුරුණෑගලට යැවූ වෛද්‍යාධාර ලබා දීම් සම්බන්ධයෙන්ද තවමත් අනුමැතියක් ලැබී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.මෙය තාවකාලිකව ඉදිරියට කල තබමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

**මේ සඳහා ගරු මහා සභාවේ අනුමැතියක් ලබා ගනිමුයැයිද, පසුව මෙය කමිටුවට දමා මේ සඳහා දායකත්වයක් ලබා දෙමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අනුමැතිය තවමත් නොපැමිණි වෛද්‍යාධාර සම්බන්ධයෙන්ද සොයා බලන ලෙසට ගරු සභාපතිතුමා විසින් ලේකම්මහතාට උපදෙස් ලබා දෙන ලදී.**

**මෙ සඳහා වෙන් කල මුදල් ප්‍රමාණයද අවසන් වී ඇති බව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

**අප සභාවේ ජ්‍යේෂ්ඨතම ගරු මන්ත්‍රීතුමාට තවමත් වෛද්‍යාධාර මුදල් ගෙවා නොමැති බව** ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.එම මුදල් ලබා දීමට කටයුතු කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

**එය ලබා දීමට නොහැකි වී ඇත්තේ එහි තිබූ ගැටළුවක් නිසා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.අඩුපාඩුවක් තිබේ නම් එය සකස් කර හැකි ඉක්මනින් එය ලබා දීමට කටයුතු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් ලේකම්මහතාට උපදෙස් ලබා දෙන ලදී.**

**ගරු ආණ්ඩුකාරතුමා ඔක්තෝම්බර් 29 වන දින පැමිණි පසුව මෙය පැවසීමට තමන් බලාපොරොත්තු වන බවත්,අප සභාව වැනි සභා කීපයක පමණක් මෙලෙස වෛද්‍යාධාර මුදල් ලබා දීමට කටයුතු කරන බවත්, ඒවා අනුමැතිය පිණිස කුරුණෑගල යැවූ පසුව කමිටුවක් රැස් වී අනුමත කර අපට අනුමැතිය ලබා දෙන බවත්, එම පමාවීමට හේතුව එය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**සභාවේ ජ්‍යේෂ්ඨතම ගරු මන්ත්‍රීතුමෙකුට වෛද්‍යාධාර ලබා දීම මෙතරම් පමා වීම සුදුසු නොවන බව** ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතාගේ ලිපි වල අඩුපාඩු තිබූ බැවින් එය පමා වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**එසේ අඩුපාඩු තිබුයේ නම් තමාට දැනුම් දීමට තිබූ බව** ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.තමන්ට මුදල් අවශ්‍ය නොවන බවත්, එම මුදල ආවරණ අනුමැතියට යටත්ව ලබා දීමට ජ්‍යේෂ්ඨ මන්ත්‍රීතුමා යෝජනා කල නමුත් තමන් එය ප්‍රතික්ෂේප කල බවත්, නීත්‍යානුකූලව ඒවා ගෙවන ලෙසට තමන් එහිදී පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී. වසර දෙකකට ආසන්නනමුත් තවමත් එය නොලැබුණ බවද ලේකම්මහතා මේ පිළිබඳව උනන්දු නොවූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා කෙදිනකවත් එය නොඉල්ලූ බවත්,මෙය ආවරණ අනුමැතියට යටත්ව ලබා දීමට පැවසූයේ තමන් බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

**එය සොයා බලා අවශ්‍ය කටයුතු කරන බව ගරු සබාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**මේවා කමිටුවට නොපැමිණිය බවත්, කමිටුව හරහා ගරු මහා සභාවට පැමිණිය යුතු බවත්** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව කල් තබන ලදී.**

**iii.** දංකොටුව රෝහලේ කොවිඩ්-19 ආසාදිතයින් සඳහා වාට්ටු දෙකක් හා කාමර 12කින් යුත් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට ආධාර මුදලක් ලබා දීම සඳහා **අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

**රටේ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වයත් සමඟ දංකොටුව රෝහල හා ලුණුවිල රෝහල කොවිඩ්-19 සඳහා ප්‍රතිකාර කරන වෛද්‍ය මධ්‍යස්ථාන ලෙස පරිවර්තනය කරගත් බවත්, ජනතාවගේ ආධාර මුදලින් හා ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ මැදිහත් වීම හා තමන්ගේ සම්පූර්ණ අධීක්ෂණය යටතේ දංකොටුව රෝහලේ වැඩකටයුතුත් ලුණුවිල රෝහල** ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාගේ මූලිකත්වයෙන් එම වැඩ කටයුතුත් සිදු වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ සඳහා බොහෝ දෙනා අනුග්‍රහය ලබා දුන් විශේෂයෙන්ම උළුමෝල් සංගමය විසින් ඔක්සිජන්

සිලින්ඩර් නොමැති අවස්ථාවේදී ඒවා ලබා දුන් බවත්, වෙළඳ සංගම් සහය වූ බවත් ප්‍රකාශ කරන ලදී.කොවිඩ්-19 තුරන් වූ පසුව දංකොටුව මූලික රෝහලේ ඉදිරියේදී ළමා හා මාතෘ වාට්ටුවක් ඇති කිරීමට ගරු රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිණිය සමඟ සාකච්ඡා කරගෙන යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.දංකොටුව රෝහලේ හෙද කාර්ය මණ්ඩලය සිටින ස්ථානය වල් බිහි වී ඇති බවත් එය සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීමට කටයුතු කරගෙන යන බවත්, මෙය බල කිරීමක් නොවන බවත් ස්ව කැමැත්තෙන් ඒ සඳහා යම් දායකත්වයක් ලබා දීමට හැකි නම් මෙම අවස්ථාවේදී වටිනා බවත්,ලබන සභා වාරයේදී එය ලබා දීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**ලුණුවිල රෝහලේද එවැනි වාට්ටුවක් තිබූ බවත්, වැඩිම ජනතාවක් පැමිණෙන රෝහලක් බැවින් එම රෝහලද මීට සමගාමීව දියුණු කරන්නේ නම් එය සුදුසු බවට යෝජනා කරන බවත්** ගරු මන්ත්‍රී බි. ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.පෞද්ගලිකව හෝ සහයෝගය ලබා දීමට තමන්ද සූදානම් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

**මෙම ආධාර මුදල් එකතු කිරීම සඳහා රෝහලේ යම් කමිටුවක් සකස් කර තිබේදැයි** ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

**රෝහලේ වැඩ කටයුතු සඳහා කමිටුවක් සකස් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**ආයතන වලින් මුදල් ඉල්ලා ඇති බවත්, එය මෙම අරමුදලට දැයිද** ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

**එම වැඩ කටයුතු වලදී දායකත්වය ලබා දුන් බවත්, එම ලිපි තමන්ගේ හා ඇමතිතුමාගේ අත්සනින් ඉදිරිපත් කර ඇති බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**මෙම සමිති ලියාපදිංචිදැයිද, ගරු මහා සභාවට ලිපියක් ඉදිරිපත් කිරීමේදී වගකීමෙන් ඉදිරිපත් කරන ලෙසත්, මේවායෙහි අයවැය සකස් කරන්නේදැයිද නොදන්නා බවත්** ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

**මෙම කටයුතු රෝහලේ වෛද්‍යතුමාගේ අධීක්ෂණය යටතේ සිදුවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මන්ත්‍රීවරුන්ට යම් දායකත්වයක් දීමට හැකි නම් එය ලබා දෙන ලෙසට තමන් ඉල්ලීමක් කරන බවද ප්‍රකාශ කරන ලදී.**

**ඝෝෂාව.....**

**මෙය ප්‍රාදේශීය සභාවේ ගිණුමක්ද? නැතිනම් මේ වෙනුවෙන් සකස් කල අරමුදලක් තිබේදැයිද යන්න** ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා විමසා සිටින ලදී.

**ගරු මන්ත්‍රීවරුන් දායකත්වය ලබා දීමට කැමති නම් වෛද්‍යතුමාට මහා සභාවට පැමිණෙන ලෙස පවසා එය ගරු මහා සභාවේදීම ලබා දිමට හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**එම රෝහලේ ගිණුමක් නොමැතිදැයි** ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

**රෝහලේ ගිණුමක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**පසුගිය දිනවල කොවිඩ්-19 සඳහා සභාවට ලැබුණ ආධාර මුදල් සහා අරමුදලේ තිබේදැයිද** ගරු මන්ත්‍රී ටි.බි.ඩි. ඇන්ටනි කුමාර් මහතා විමසා සිටින ලදී.

**සභාවේ කොවිඩ්-19 අරමුදලක් නොමැති බවත්, ලුණුවිල රෝහල සංවර්ධනය කිරීමට** ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා සහ තමන් අධීක්ෂණය කර කටයුතු කල බවත්,දංකොටුව රෝහල සංවර්ධනය කිරීමට කමිටුවක් ස්ථාපිත කල බවත් එම කමිටුව මඟින් එම වැඩ කටයුතු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. **එම මුදල් පරිහරණය කර සම්පූර්ණ අයවැය ලබා දී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.**

**ගරු සභාපතිතුමා ඉදිරිපත් කල මෙම යෝජනාව තමන් ස්ථිර කරන බව** ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම තමන්ගේ දීමනාවන් කොවිඩ්-19 වසංගතය තුරන් වන තුරුම හෝ යම් මුදලක් ලබා දීමට සූදානම් බවත්, අනෙක් ගරු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කර ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 05

දංකොටුව රෝහලේ කොවිඩ්-19 ආසාදිතයින් සඳහා වාට්ටු දෙකක් හා කාමර 12කින් යුත් ගොඩනැඟිල්ල අළුත්වැඩියා කිරීමට යම් ආධාර මුදලක් ඊළඟ මහා සභා වාරයේදී ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනාවෙන් පරිත්‍යාග කරමුයැයිද , එම මුදල දංකොටුව රෝහලේ වෛද්‍යතුමාගේ අතටම ගරු මහා සභාවේදී ලබා දෙමු යැයිද ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**iv.** මුදල් රෙගුලාසි අංක 756 අනුව සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ගබඩා හා භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර වාර්ථා කල යුතු බැවින් 2021.12.31 දිනට අදාලව භාණ්ඩ සමීක්ෂණ කාල සටහන හා සමීක්ෂණ කටයුතු හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කමිටු සඳහා සහභාගී වන නිලධාරීන්ට සමීක්ෂණ කටයුතු සිදු කරන දිනකට රු.1000ක් බැගින් දීමනාවක් ලබා දීමට **අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

නිලධාරීන් මෙය රාජකාරියට අමතරව සිදු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහි කුඩා ගැටළුවක් තිබෙන බවත්, පුස්තකාල ගත් විට මීට 06 මාසයකට පෙර ලබා දුන් පොත් තවමත් ලැබී නොමැති බවත්, මෙය කලහොත් LOST එකකට වාර්තා ගත කිරීමට සිදු වන බැවින් මෙය අවසානයට කරනා වැඩ පිළිවෙලක් සකස් කරමුයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. පුස්තකාල පසුවට දමා අනෙක් ස්ථාන නල භාණ්ඩ සමීක්ෂණය සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී. මේ සඳහා මාසයක් කල් දුන්නේ නම් ප්‍රමාණවත් බවත් කවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 06

2021.12.31 දිනට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට අදාල කාලසටහන හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කමිටු සඳහා සහභාගී වන නිලධාරීන්ට දිනකට රු.1000.00ක දීමනාවක් ලබා දීමට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලද අතර සමීක්ෂණ කටයුතු සිදු කිරීමේදී පුස්තකාල සඳහා මාසයක පමණ සහන කාලයක් ලබා දීම සුදුසු බවද යෝජනා කරන ලදී. ඒ අනුව එම**

**තීරණ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**v.** සභා අරමුදලින් එදිනෙදා අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි යැයි සභාවේ සභාපති විසින් සලකා පහසුවෙන් මුදා හැරිය හැකි මුදල් ප්‍රමාණයක් ස්ථිර තැන්පතුවක ආයෝජනය කිරීම හා එම මුදල් ආපසු මුදා ගැනීම සම්බන්ධයෙන් තිරණය කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කාරක සබාවේ බලතලයත් ලෙස ඇතුළත් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට **අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

**හදිසි මුදල් අවශ්‍යතාවයක් ඇති වුවහොත් එය ගෙවන්නේදැයිද මන්ද ඉඩමක් ගැනීමට යාමේදී එය මහා සභාවට දමා තීරණ ගෙන මුදල් ගැනීමේදී එම ඉඩම නැති වී යන බවත්** ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.
**එය එසේ කල හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

තීරණ අංක 07

සභා අරමුදලින් එදිනෙදා අවශ්‍ය ප්‍රමාණයට වඩා අතිරික්තයක් ඇතැයි සභාවේ සභාපති විසින් අදහස් කරන අවස්ථා වලදී ඒ පිළිබඳව සලකා පහසුවෙන් මුදා හැරිය හැකි මුදල් ප්‍රමාණයක් ස්ථිර තැන්පතුවක ආයෝජනය කිරීම හා අවශ්‍ය විටක එම මුදල් ආපසු මුදා ගැනීම සම්බන්ධයෙන් තිරණය කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ බලතලයත් ලෙස ඇතුළත් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**vi.** ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මැල්වත්ත පොදු කටයුතු සඳහා වෙන්කර ඇති භූමියෙන් ඉඩම් කොටසක් සී/ස දන්කොටුව විවිධ සේවා සමූපාකාර සමිතිය වෙත ලබා දීම සඳහා සභාවේ එකඟතාවය ඉල්ලා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සලකා බැලීම සඳහා ගරු මහා සභාව වෙත ගරු **සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

**ඉඩම් කොටස් බෙදීමේදී පොදු කොටසක් වෙන් වී ඇති බවත්, එය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට තවමත් අයත් බවත්, හෙට දින එය ඉඩම් ලබා දීමට දිනයක් හා වේලාවක් ලබා දීමට කටයුතු සූදානම් කර තිබූ බවත්, එහිදී සභාවට ලැබුණු පොදු කොටස මෙහිදී ඉල්ලා ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එහිදී ඔප්පුව හදාගෙන මෙම ආයතනයට බදු දීම සුදුසුයැයි තමන් යෝජනා කරන බවද ප්‍රකාශ කරන ලදී.**

**භුක්තිය නොදී බදු දීමට කටයුතු කරමුයැයි ගරු මන්ත්‍රී ඒම මහතාකිත්සිරි අභයවික්‍ර.එම්.එස්. ප්‍රකාශ කරන ලදී.**

**ක්‍රීඩාංගණයත් සමඟ තිබෙන කොටසක් සම්බන්ධයෙන් මෙහිදී කියවෙන බව** ගරු මන්ත්‍රිනි අයි. එච්. නයෝමි රම්‍යලතා මහත්මිය **ප්‍රකාශ කරන ලදී. ක්‍රීඩාපිටියට කිසිසේත් හානියක් නොවන අන්දමින් එම කටයුතු සිදු කරදෙන ලෙසද ප්‍රකාශ කරන ලදී.නීත්‍යානුකූලව බදු දීමේ පදනම මත එය ලබාදෙන ලෙසටද ප්‍රකාශ කරන ලදී.**

**මෙම කොටස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් බවත්, 2010 වර්ෂයට පෙර පදිංචි වූ පිරිසට ඔප්පු සාදා දීමක් වන බවත්, එහි පොදු කොටස් 2ක් තිබෙන බවත්, එකක් පෙර පාසල තිබෙන කොටස හා අනෙක ක්‍රීඩාපිටිය අසල තිබෙන කොටස බවත් මෙහිදී ඉල්ලා ඇත්තේ ක්‍රීඩාපිටිය අසල කොටස බවත්** ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. සභාවට ඔප්පුවක් ලැබී බදු දීමේ කටයුත්ත කෙසේ සිදුවේදැයි නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.දැනට එහි අයිතියක් නොමැති බවත්, පවරා දීමට මේ වන විටද යම් ක්‍රමවේදයක් නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

**මෙය පොදු කොටසක් ලෙස සභාවට වෙන් කර ඇති බවත් තමන් එය සොයා බැලූ බවත්, සභාවට ඔප්පුවක් ලබාදෙන බවට පැවසූ බවත් එය ඔප්පුව ඉල්ලා මෙමෙ කොටස බදු දෙමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**
**එය ලබා දීමට ගියහොත් මුදලක් ගෙවීමට සිදු වන බවද, නිවාස සංවර්ධන අධිකාරියෙන් බෝතලේගම ක්‍රීඩා පිටියට වූ ප්‍රශ්නයම මෙහිදීත් සිදු වන බව** ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

**සිරිගම්පල පොල භූමියට, සහනගම ක්‍රීඩාංගණයට වැනි ස්ථාන සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට මුදල් ගෙවූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

තීරණ අංක 08

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මැල්වත්ත ග්‍රාමයේ පිහිටි පොදු කටයුතු සඳහා වෙන්කර ඇති මුළු භූමි ප්‍රමාණයම සභාවට ලබාදෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත දැනුම් දීමටත් එසේ එම පොදු කොටස ලබා දුන් පසුව සභාව විසින් සීස දන්කොටුව විවිධ සේවා / සමුපාකාර සමිතිය වෙත බදු පදනමට ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු **මන්ත්‍රී ඒඒ අනුව ඒ .ම මහතා විසින් ස්ථිර කරන ලදීකිත්සිරි අභයවික්‍ර.එම්.එස්. සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී**

**vii.** වර්ෂයේ සභාවේ අයවැය ලේඛණයට පරිභාහිරව වෙනත් 2021ආයතන මඟින් ලැබී ඇති ප්‍රතිපාදන සඳහා ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවට ගරු මහා සභාවේ අනුමැතිය ලබා වර්ෂයේ දෙවන පරිපූරක 2021 දීම සුදුසු බවට **අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

තීරණ අංක 09

2021 වර්ෂයේ දෙවන පරිපූරක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**(ඇමුණුම i)**

**viii.**2022 වර්ෂයේ ජනවාරි මස ම ගැනීමට නියමිත බැවින් දැනට සභාවේ වන දින ලේකම්මහතා විශ්‍රා 02 වර්ෂයට අදාල අයවැය ලේඛණය සකස් කිරීම ආදී කටයුතු 2022 පවත්වා ගෙන යන සංවර්ධන කටයුතු හා යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා තවදුරටත් වසරක සේවා දිගුවක් ලබා දීම සඳහා වයඹ පලාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට **අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

**මෙය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සිදු වන බවත්, සියළු දෙනාගේම කැමැත්ත ඒ සඳහා ලබා දෙන ලෙසත් ගරු සහපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**වෙනත් ලේකම්වරයෙකුට පැමිණ මෙම වැඩකටයුතු කිරීමට නොහැකිදැයි** ද ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී. මෙහිදී බෙදීමක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

**ආණ්ඩුපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ බෙදිමක් තිබේදැයිද ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.**

**ආණ්ඩුපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ නොව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ බෙදීමක් තිබෙන බවත්,ආණ්ඩුපක්ෂයේද හෘද සාක්ෂියට එකඟව කටයුතු කරන ගරු මන්ත්‍රීවරුන් සිටී නම් මෙයට විරුද්ධ වන බවත්** ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.ලේකම්තුමා මෙතැනින් ගිය පසු රාජකාරිය නොදන්නා පුද්ගලයෙකු මෙම තනතුර සඳහා නොපැමිණෙන බවත්, ගරු සභාපතිතුමාද ඉවත් වූ පසුව සභාපතිවීමට කැමති මන්ත්‍රීවරුන් සිටින්නා සේම ලේකම්තුමා ගිය පසුව මෙම ආයතනට පැමිණීමට කැමති රාජ්‍ය සේවකයින්ද සිටින බවත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා තීරණයක් ගැනීම සඳහා යෝජනාවක් ගරු මහා සභාවට ඉදිරිපත් කල පසුව ඒ සඳහා අදහස් ඉදිරිපත් කිරීමේ අයිතියක් ගරු මන්ත්‍රීවරුන්ට තිබෙන බවත් ගරු සභාපතිතුමා වෙන්නප්පුවේ සිටින සියළුම ජනතාව නියෝජනය නොකරන බවද ප්‍රකාශ කරන ලදී.

**තමන් එක්ලක්ෂ පනස් දහසක් වූ වෙන්නප්පුව බල ප්‍රදේශයේ සියළුම ජනතාව නියෝජනය කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**සියළු දෙනාම ගරු සභාපතිතුමාගේ අදහස් වලට එකඟ නොවන බවට තමන් මෙහිදි පැවසූ බව** ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

**එය පෞද්ගලික මතයක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**ජනමතය ලෙස කොට්ඨාස 25න් 24ක් ආණ්ඩුපක්ෂයට ලැබුණ බවත්, මෙම ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය තිබේ නම් ඉන් එහාට කතා කිරීමට දෙයක් නොමැති බවත්, විරෝධතාවයක් තිබේ නම් එය ඉදිරිපත් කරන ලෙසත්** ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

**බහුතරයේ කැමැත්ත මත එම කටයුත්ත සඳහා අවසරය ලැබෙන බව ගරු සභාපතිතුමා නිවේදනය කරන ලදී.**

**විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මේ සඳහා විරුද්ධ බව** ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා මෙහිදි ප්‍රකාශ කරන ලදී.

**විරෝධතාවයක් තිබේ නම් අත ඔසවන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**මෙය සදාචාරාත්මක නොවන බවත්, ලේකම්තුමාට ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කරන ලෙසට පවසන ලෙසත්** ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

ලේකම්තුමාගේ වසරක සේවා දිගුව සඳහා තමන් කැමති බවත්, අකමැති කෙනෙකු සිටී නම් නාමිකව ඉදිරිපත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ලේකම්තුමා කල සේවාවට කෘතගුණ සැලකීමක් ලෙස මෙය සිදු කරන බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

ලේකම්තුමා සමඟ අප සියළුම දෙනා වැඩ කරන බවත්,එතුමා ජනවාරි මස විශ්‍රාම යන්නේ නම්ද මෙහි ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක්ද තිබෙන බැවින් එමෙන්ම බෙදීමක්ද ඉල්ලන්නේ නම් රහස් ඡන්දයකට යමුයැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

රහස් ඡන්දයකට යාමට අවශ්‍ය නොවන බවත්, ප්‍රසිද්ධියේ මෙහි ඡන්දය ඉදිරිපත් කල හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව....

ගරු සභාපතිතුමාට පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විශ්වාස නම්, රහස් ඡන්දයකට යමුයැයි ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී. රහස් ඡන්දයේදී අවංකභාවය තිබෙන බවත්, මන්ත්‍රීවරුන්ව මෙලෙස හැල්ලුවට ලක් නොකරන ලෙසත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

මිනිසුන්ගේ අඩුපාඩු තිබිය හැකි බවත්, තම පෞද්ගලික අකමැත්ත නාමිකව සඳහන් කරන ලෙසද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. මෙය කෘතගුණ සැලකීමක් ලෙස යෝජනා කල බවත් මෙහිදී සුදුහුණු ගැමක් සිදු නොවන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී තවත් කෙනෙකුට අවස්ථාවක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින බව ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

ලේකම්මහතා වසර 30ක් පමණ රැකියාව කර,අවසාන මෙහොතේ එතුමාව අපහසුතාවයට පත් කර එතුමාගේ සේවා ධූරයට අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති නොකරන ලෙසට ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ඉල්ලා සිටින ලදී.

ඝෝෂාව.....

ආණ්ඩුපක්ෂයේ කැමැත්ත මත සහ බහුතර කැමැත්තෙන් මෙම යෝජනාව ස්ථිර වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ තීන්දු නොගන්නා ලෙස ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

නාමිකව එම විරෝධතාවය සඳහන් කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ සේවාවක් කර මෙවැනි අවස්ථාවක් පැමිණි පසුව එතුමාව සභාවේ තබාගෙන මෙලෙස කතා කිරීම සුදුසු නොවන බවත්, සදාචාර සම්පන්න නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මිනිසුන් කාගේත් හොඳ නරක දෙකම තිබෙන බවත්, ලේකම්මහතාගේ වැරදි නම් ගණනාවක් තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ගිය වර මහා සභා වාර්තාවේ " මෙහිදී ලේකම්තුමා විශ්‍රාම යාමට සූදානම් බවත්, මෙය තමන්ගේ ඉල්ලීමක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම සියළුම කටයුතු දිවා රාත්‍රී නොබලා මහන්සි වී ගත් උත්සාහයේ ප්‍රතිපලයන් බවත් එයට ගෞරවයක් වශයෙන් තමන් ඉල්ලීමක් කල බවත්, එයට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත පමණක් අවසරය ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී. විධිමත් අයදුම්පත්‍රයක් තිබෙන බවත් ලේකම්තුමාට කොන්ත්‍රාත් පදනම මත තවත් වසරක් ඉල්ලීමට හැකි බවත්, එයට අවසරය ලබා දුනහොත් සිටීමට හැකි බවත් ගරු මන්ත්‍රීවරුන් අත්සන් කර යැවීම අවශ්‍ය නොවන බවත් ගරු මන්ත්‍රී එම්ශ විජිනේන්ද්‍ර .එම්.්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. "ලෙස සඳහන් වන බවත් ප්‍රකාශ කරන ලදී.

සාමාන්‍යයෙන් විශ්‍රාම වයසක් නියම කර තිබෙනුයේ විශ්‍රාම ගිය පසුව පහළින් සිටින තවත් කාලයක් වැඩ කිරිමට හැකි නිලධාරීයෙකුට පැමිණ වැඩ කර අත්දැකීම් ලබා ගැනීමට බවත් එය සාම්ප්‍රදායික ක්‍රමය බවත් ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.එවැනි සුදුසුකම් තිබෙන නිලධාරියෙකුට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වැනි ඉතාමත් ආදායම් ලබන ආයතනයක ලේකම් ධූරයට පැමිණීමට

තිබෙන අවස්ථාව මෙහිදී අහිමි වී යන බවත් ප්‍රකාශ කරන ලදී. මෙම කෙටි කාලය තුළ ලේකම්තුමාගේ දුටු අඩුපාඩු අප්‍රමාණ බවත්, විවේචනයට තමන් අකමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මීට වසර දෙකකට පෙර ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ගරු මහා සභාවට යොමු කර තමාට රු.50,000ක වෛද්‍යාධාර මුදල් ලබා දීමට යෝජනා කල බවත්, නමුත් තමන් එයට අවශ්‍ය ලිපි ලේඛණ නොදී කාලයක් මගහරිමින් සිට අවසන් මෙහොතේ තමන් එය ලබාදුන් බවත් එයද ලබා දී මාස ගණනාවක් ගත වූ බැවින් ඒ පිළිබඳව තමන් මුදල් කමිටුවේදී විමසා සිටි බවත් එසේ විමසන විට ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතාටද එම වෛද්‍යාධාර මුදල ලැබී තිබූ බවද ප්‍රකාශ කරන ලදී. තමන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් නිලධාරීතුමිය කතා කර ඉල්ලූ බවත් එවිටත් තමන් ඒ සියල්ලම භාර දී තිබූ බවත් පරිපාලනය යනු එය නොවන බවත් එලෙස සිදු වී ද මාස 5ක් පමණ ගත වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ජ්‍යේෂ්ඨ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා මෙය ආවරණ අනුමැතියට යටත්ව ලබාදෙන ලෙසට පැවසුවද තමන් එයට විරුද්ධ වූ බවත් නමුත් අද වන තෙක් තිබෙනවායැයි පවසන අඩුපාඩුවක් සම්බන්ධයෙන් හෝ කිසිඳු දැනුම් දීමක් සිදු කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

ලේකම්තුමා සභාපතිතුමාගේ ඉල්ලීම අනුව කටයුතු කල බවට පැවසූ බවත් මෙහිදී වැරදි නොව පරිපාලනමය දුර්වලතා පෙනවා දෙන බවත් එම හේතු කාරණා අනුව සහ සමාජයේ මධ්‍යස්ථව සිටින පුද්ගලයෙකු ලෙස තමන් කතා කරන බවත් කවුරුන් ලේකම් ධූරයට පැමිණියද මෙම කටයුතු කිරීමට සිදු වන බවත් එය රාජ්‍ය තන්ත්‍රයේ ක්‍රමවේදය බවත් ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.ලේකම්තුමාට විරුද්ධව නොව සදාචාරය අනුව තමන් කටයුතු කරන බවත් සභාවේ මුදල් රෙගුලාසි වලට පිටින් ලේකම්තුමාට වාහනයක්ද ලබා දී ඇති බවත් එය නීත්‍යානුකූල නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

මේ වන විට මෙම සභාවේ පමණක් නොව සියළුම සභා වල ලේකම්වරුන්ට ප්‍රවාහන පහසුකම් සපයන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වාහනය සඳහා දවසට විශාල පිරිවැයක් දැරීමට සිදු වන බව ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

යථාර්තය පෙන්වා දුන් බවත්, ලේකම්තුමා සමඟ කිසිවෙකු අමනාප නොවන බවත් ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ සඳහා විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

විරුද්ධ ගරු මන්ත්‍රීවරුන්ට අත ඔසවන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දුන් අතර ස්වාධීනව සිටින අයට ස්වාධීනව සිටින ලෙසද ප්‍රකාශ කරන ලදී.

ප්‍රතිපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වන ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා, ගරු මන්ත්‍රී එම්.ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා,ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය, ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා, ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා, ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා යන ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රීවරියන් 08 දෙනෙකු පමණක් අත් ඔසවා විරෝධතාවය ප්‍රකාශ කල අතර අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් විරෝධතාවය ප්‍රකාශ නොකරන ලදී.

ඒ අනුව බහුතර කැමැත්තෙන් මෙම යෝජනාව සම්මත වන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 10

2022 වර්ෂයේ ජනවාරි මස 02 වන දින සිට ලේකම්මහතා විශ්‍රාම ගැනීම හේතුවෙන් පුරප්පාඩු වන ලේකම් තනතුර සඳහා තවදුරටත් ලේකම්මහතාගේ සේවා කාලය කොන්ත්‍රාත් පදනම මත 2023

ජනවාරි මස 02 දක්වා වසරක කාලයක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සුදුසු බවත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමටත් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදුව ගරු මහා සභාවේ බහුතර කැමැත්තෙන් සභා සම්මත විය .

**ix.** **ආදහනාගාරය සඳහා යොදා ගන්නා 37.5 L ගෑස් ටැංකියක මිල රු.6,726.00 සිට රු.7,926.00 දක්වා වැඩි වී ඇති බැවින් එම මිල යටතේ ගෑස් මිලදී ගැනීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

**මෙහිදී රු.1000ක මුදලින් ආදහනාගාර ගාස්තුවද වැඩි කරමුයැයි ද ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.**

**ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රීවරයෙකුගේ පවුලේ අවමංගල්‍යයක් අවස්ථාවේදී නොමිලයේ ආදහනය කිරීම සඳහා අවශ්‍ය නීතිමය තත්ත්වය සාදාගෙන කටයුතු කරමුයැයි ගරු සභාවට යෝජනා කරන ලදී.**

**එම යෝජනාව සඳහා කලත්‍රයාගේ මව හා පියාද ඇතුළත් කර ගන්නා ලෙස** ගරු මන්ත්‍රිනි අයි. එච්. නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

**එම යෝජනාව සඳහා නිලධාරීන්ද ඇතුළත් කර ගනිමුයැයි ද එයද වටිනා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**මෙහිදී සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමාගේ හෝ ගරු මන්ත්‍රීතුමියගේ මව,පියා,කලත්‍රයා , දරුවන් සහ කලත්‍රයාගේ මව හා පියා යන පිරිසෙන් කිසියම් කෙනෙකු අභාවප්‍රාප්ත වූ විට ආදහනාගාර ගාස්තුවෙන් නිදහස් කරමුයැයි ගරු මන්ත්‍රී ඒ මකිත්සිරි අභයවික්‍ර.එම්.එස්.**මහතා ප්‍රකාශ කරන ලදී.

**ඝෝෂාව.....**

**ආදහනය කිරීම සඳහා කොපමණ මුදලක් අය කරන්නේදැයි** ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා විමසා සිටින ලදී.

**රු.8000ක් අය කරනා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**තමාගේ පෞද්ගලික මතය නම් එලෙස කටයුතු නොකිරීම බව** ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

**එම යෝජනාව සංශෝධනය කරගනිමුයැයිද මෙතැන කිසිවෙකුඑය බලාපොරොත්තු වන්නේයැයි තමන් නොසිතන බවත්** ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී. අවමංගල්‍යයක් අවස්ථාවේදී ගෞරවයක් ලබා දිය යුතු බවත්, නමුත් මෙම ලබා දෙන අවස්ථාව සේවක මහත්මමහත්මීන්ට ලබා දෙමුයැයිද ප්‍රකාශ කරන ලදී.

**ඇත්තෙන්ම ගරු මන්ත්‍රීවරුන්ට ගෞරවයක් ලබා දීම පිණිස මෙවැනි යෝජනාවක් ගෙනා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**මෙහිදී කොවිඩ්-19 නිසා ආදහනය සිදු වන බවත්, නැතිනම් බොහෝ විට සාමාන්‍ය බූමදානයක් සිදු වන බවත් මෙහිදී මෙම අවස්ථාව ගැනිමට අවශ්‍ය කෙනා ගන්නා ලෙසත් අවශ්‍ය නැතිනම් නොගෙන සිටින ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්නාන්දුජෝන් බැප්ටිස් ප්‍ර. මහතා ප්‍රකාශ කරන ලදී.**
**ඊළඟ සභා වාරයේදි මෙය සාකච්ඡා කරමුයැයි ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.**
**ගැස්මිල වැඩි වීම මත ආදහනාගාර ගාස්තු වැඩි කලාක් මෙන් ගැස් මිල අඩු වූ විට එම ගාස්තුව ද අඩු කරන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්නාජෝන් බැප්ටිස් ප්‍ර.න්දු මහතා ප්‍රකාශ කරන ලදි.**

තීරණ අංක 11

ආදහානාගාර සඳහා මිලදී ගන්නා ලීටර් 37.5 ගැස් ටැංකියක මිල රු.6,726.00 සිට රු.7,926.00 දක්වා වැඩි වී ඇති බවත් එබැවින් එම මිල ගණනට එම ගැස් මිලදී ගැනීමටත් එම මිල වැඩි වීම යටතේ ආදහානාගාර ගාස්තුවද රු.1000ක මුදලකින් වැඩි කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**b.** ගරු මන්ත්‍රී යෝජනා

**i.** වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක /482ඒජාඑක්සත් ප්‍ර " ම නිලධාරී වසමේවයික්කාල ග්‍රා.ද , මණ්ඩලය "ලියාපදිංචි කිරීම සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතා ඇලෙක්ස් නිශාන්ත ප්‍ර. විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

තීරණ අංක 12

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 482/ඒ, ද.වයික්කාල ග්‍රාම නිලධාරී වසමේ " එක්සත් ප්‍රජා මණ්ඩලය" ලියාපදිංචි කිරීම සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් කරන ලද යෝජනාව **ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**ii.** හාල්දඬුවන ග්‍රාම නිලධාරී කොට්ඨාසය සඳහා පිහිටුවා ගත් "අභය" ප්‍රජා මණ්ඩලය වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාලව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම** මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

තීරණ අංක 13

හාල්දඬුවන ග්‍රාම නිලධාරී කොට්ඨාසය සඳහා පිහිටුවා ගත් "අභය" ප්‍රජා මණ්ඩලය වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාලව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම** මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**iii.** මැද දූම්මලදෙණිය පංසල් හන්දිය ප්‍රධාන පාරට මුහුණලා ඇති පැරණි තැපැල් කාර්යාලය තිබූ ඉඩමෙන් පර්චස් ක බිම්40කොටසක් මිල දී ගැනීමට අදාලව ගරු මන්ත්‍රී යුජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් . කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, දීර්ඝ කාලයක් මුළුල්ලේ පන්සල් හංදියේ තිබූ තැපැල් කන්තෝරු ඉඩම සම්බන්ධයෙන් මෙහිදී කතා කරන බවත්, මෙම ඉඩමට නඩුවක් තිබූ බවත්, එම නඩුව යන අතරතුර පර්චස් 01ක් ලක්ෂ 02ක මුදලකට වර්තමාන අයිතිකරු නැවත මිලදී ගත් බවත් ප්‍රකාශ කරන ලදී. කිසිඳු ප්‍රයෝජනයක් නොමැතිව මෙම ඉඩම කොටස් දෙකකට වෙන් කරගෙන ඇති බවත්, දූම්මලදෙණිය ග්‍රාමයට පොදු ස්ථානයක් නොමැති බවත්, එබැවින් මෙම පර්චස් 40ක බිම් කොටස ලබා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසට ගරු මහා සභාවෙන් ඉල්ලා සිටින ලදී.

**රජයේ තක්සේරුව යටතේ මෙම ඉඩම ලබා දීමට කැමතිදැයි** ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

**එම වැඩ කටයුතු කරගෙන යාම සඳහා මෙය ඉදිරිපත් කල බවත්, එම නඩුවද අවසන් වී ඇති බවත්** ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

**එසේ නම් නඩු වාර්තාද ඉදිරිපත් කරන ලෙසට** ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 14

මැද දූම්මලදෙණිය පංසල් හන්දිය ප්‍රධාන පාරට මුහුණලා ඇති පැරණි තැපැල් කාර්යාලය තිබූ ඉඩමෙන් පර්චස් 40ක බිම් කොටසක් රජයේ තක්සේරු මුදලට මිලදී ගැනීමට අදාලව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**iv.** බ/කහටවිල පන්සල් හංදියේ සිට හුන්දිරාපොල ප්‍රධාන පාරේ ජයරත්න මහතාගේ නිවස ඉදිරි පසින් වමට ඇති හරස් මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -කිරිමැටියාන හුන්දිරිපොල පාර**
- **අවසන් වන ස්ථානය - සම්පත් මහතාගේ නිවස**
- **මාර්ගයේ දිග- මීටර් 36**
- **මාර්ගයේ පළල - අඩි 08**
- **ග්‍රාම සේවා වසම කහටවිල/බ -**

තීරණ අංක 15

බ/කහටවිල පන්සල් හංදියේ සිට හුන්දිරාපොල ප්‍රධාන පාරේ ජයරත්න මහතාගේ නිවස ඉදිරි පසින් වමට ඇති හරස් මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී .ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -කිරිමැටියාන හුන්දිරිපොල පාර**
- **අවසන් වන ස්ථානය - සම්පත් මහතාගේ නිවස**
- **මාර්ගයේ දිග- මීටර් 36**
- **මාර්ගයේ පළල - අඩි 08**
- **ග්‍රාම සේවා වසම -බකහටවිල/**

**v.** බ/කහටවිල පන්සල පාරේ රුක්ෂාන් මහතාගේ නිවස අසල පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -කහටවිල පන්සල පාර තුෂාර යාපා නිවස අසල**
- **අවසන් වන ස්ථානය - එච්.ඒ.රුක්ෂාන් සනෝජ් ගේ නිවස**
- **මාර්ගයේ දිග- අඩි 300**
- **මාර්ගයේ පළල - අඩි 10**
- **ග්‍රාම සේවා වසම කහටවිල/බ -**

තීරණ අංක 16

බ/කහටවිල පන්සල පාරේ රුක්ෂාන් මහතාගේ නිවස අසල පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී . ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -කහටවිල පන්සල පාර තුෂාර යාපා නිවස අසල**
- **අවසන් වන ස්ථානය - එච්.ඒ.රුක්ෂාන් සනෝජ් ගේ නිවස**
- **මාර්ගයේ දිග- අඩි 300**
- **මාර්ගයේ පළල - අඩි 10**
- **ග්‍රාම සේවා වසම -බ/කහටවිල**

**vi.** බ/කහටවිල පන්සල් හංදියේ සිට හුන්දිරාපොල දක්වා ප්‍රධාන පාරේ උළු මෝල අසලින් වමට ඇති තාණුකච්චිය මෝල පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -කහටවිල පොතුවටවන ප්‍රධාන පාරේ සිට**
- **අවසන් වන ස්ථානය - -**
- **මාර්ගයේ දිග- මීටර් 200**
- **මාර්ගයේ පළල - මීටර් 4.5**
- **ග්‍රාම සේවා වසම කහටවිල/බ -**

තීරණ අංක 17

බ/කහටවිල පන්සල් හංදියේ සිට හුන්දිරාපොල දක්වා ප්‍රධාන පාරේ උළු මෝල අසලින් වමට ඇති තාණුකච්චිය මෝල පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව
**ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී .ඒ අනුව ඒ සඳහා මහා**

**සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -කහටවිල පොතුවටවන ප්‍රධාන පාරේ සිට**
- **අවසන් වන ස්ථානය - -**
- **මාර්ගයේ දිග- මීටර් 200**
- **මාර්ගයේ පළල - මීටර් 4.5**
- **ග්‍රාම සේවා වසම -බ/කහටවිල**

**vii.** බ/කහටවිල පන්සල් හංදියේ සිට හුන්දිරාපොල දක්වා ප්‍රධාන පාරේ හුන්දිරාපොල අශෝක මහතාගේ (ලී මඩුව තිබෙන නිවස අසලින්) දකුණට ඇති හරස් මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -හුන්දිරාපොල කාපට් පාර අසල අශෝක ලී මඩුව**
- **අවසන් වන ස්ථානය - කුඹුරු යාය**
- **මාර්ගයේ දිග- මීටර් 500**
- **මාර්ගයේ පළල - අඩි 12**
- **ග්‍රාම සේවා වසම කහටවිල/බ -**

තීරණ අංක 18

බ/කහටවිල පන්සල් හංදියේ සිට හුන්දිරාපොල දක්වා ප්‍රධාන පාරේ හුන්දිරාපොල අශෝක මහතාගේ (ලී මඩුව තිබෙන නිවස අසලින්) දකුණට ඇති හරස් මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී .ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -හුන්දිරාපොල කාපට් පාර අසල අශෝක ලී මඩුව**
- **අවසන් වන ස්ථානය - කුඹුරු යාය**
- **මාර්ගයේ දිග- මීටර් 500**
- **මාර්ගයේ පළල - අඩි 12**
- **ග්‍රාම සේවා වසම -බ/කහටවිල**

**viii.** මැ/ලුණුවිල විජයරත්න මාවත වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -ලුණුවිල බුළුගහ පාර**
- **අවසන් වන ස්ථානය - පෞද්ගලික ඉඩම**
- **මාර්ගයේ දිග- මීටර් 145**
- **මාර්ගයේ පළල -මීටර් 5**
- **ග්රාම සේවා වසමලුණුවිල/මැ -**

තීරණ අංක 19

මැ/ලුණුවිල විජයරත්න මාවත වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති

යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී .ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- ආරම්භ වන ස්ථානය -ලුණුවිල බුළුගහ පාර
- අවසන් වන ස්ථානය - පෞද්ගලික ඉඩම
- මාර්ගයේ දිග- මීටර් 145
- මාර්ගයේ පළල -මීටර් 5
- ග්‍රාම සේවා වසම - මැ/ලුණුවිල

**ix.** නැ/දංකොටුව වලව්වත්ත මාර්ගයේ තුන්මං හංදියෙන් ආරම්භ වී මැටිකොටුව අතුරු පාරින් අවසන් වන මාර්ගය හෙරිටේජ් ගාර්ඩින්ස් මාවත නමින් නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

- මාර්ගයේ නම - හෙරිටේජ් ගාර්ඩින්ස් මාවත
- ආරම්භ වන ස්ථානය -වලව්වත්ත මාර්ගයේ (තුන්මං හංදියෙන්)
- අවසන් වන ස්ථානය - මැටිකොටුව අතුරු පාර
- මාර්ගයේ දිග- -මීටර් 157
- මාර්ගයේ පළල -මීටර් 3
- ග්‍රාම සේවා වසම - නැදංකොටුව/

තීරණ අංක 20

නැ/දංකොටුව වලව්වත්ත මාර්ගයේ තුන්මං හංදියෙන් ආරම්භ වී මැටිකොටුව අතුරු පාරින් අවසන් වන මාර්ගය හෙරිටේජ් ගාර්ඩින්ස් මාවත නමින් නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- මාර්ගයේ නම - හෙරිටේජ් ගාර්ඩින්ස් මාවත
- ආරම්භ වන ස්ථානය -වලව්වත්ත මාර්ගයේ (තුන්මං හංදියෙන්)
- අවසන් වන ස්ථානය - මැටිකොටුව අතුරු පාර
- මාර්ගයේ දිග- මීටර් 157
- මාර්ගයේ පළල -මීටර් 3
- ග්‍රාම සේවා වසම - නැදංකොටුව/

## 05. කාරක සභා වාර්තා සලකා බැලීම.

i. 2021.09.06 / 2021.09.15 සහ 2021.09.21 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම

තීරණ අංක 21

2021.09.06 / 2021.09.15 සහ 2021.09.21 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ හා ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2021.09.14 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 22

2021.09.14 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

මේ වන විට වීථි පහන් සඳහා ඉතාම අවම මිලක් වැය වී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ මාසයේ එක් සතියක් නොපැමිණි බවත්, බල්බ නොමැති බවත් එසේ සිදු වන්නේ මන්දැයි ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා විමසා සිටින ලදී.

බල්බ සැපයුම්කරු හදිසි අනතුරකට ලක් වී තිබූ බවත්, නීතිය අනුව වෙනත් සැපයුම්කරුවෙකුගෙන් ගැනීමටද නොහැකි බැවින් දින කීපයක ප්‍රමාදයක් සිදු වූ බව ගරු මන්ත්‍රී යු. ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. අයිතිකරුගේ බිරිඳ ලවා අදාල ආයතනයට කතා කර විශාල වෙහෙසක් දරා මෙම වැඩකටයුතු කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

තුලාවල ප්‍රදේශයේ කැළෑ ඇති බවත්, විදුලි බල්බ අනිවාර්යයෙන්ම දැමිය යුතු බවත් මන්දැයි ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී. අවශ්‍ය උපකරණ ගබඩා කරගෙන තබා ගත යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. විදුලි කාර්මිකයින් දහවල් 11ට පැමිණෙන බවත්,කොට්ඨාස වලට පැමිණීමේදී එන මඟ තිබෙන අළුත්වැඩියාද කරගෙන පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී.

හෙට දිනයේදී විදුලි වාහන දෙකම තුලාවල කොට්ඨාසයට යවන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. ගරු මන්ත්‍රීතුමා එම ස්ථානයට නැවිත් සිටිය හොත් තමාට තවදුරටත් පවසන ලෙසටද දැනුම් දෙන ලදී.

අවශ්‍ය උපකරණ නොමැතිව විදුලි වාහන කොට්ඨාස වලට නොඑවන ලෙසට ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

පසුගිය දිනවල කොවිඩ්-19 වසංගතයත් සමඟ එක් වාහනයක් පමණක් වැඩ කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මාසික වැය වූ මුදල අඩු වී ඇත්තේ අවශ්‍ය උපකරණ නොමැති නිසා නම් ඒ සඳහා සතුටු වී පලක් නොමැති බව ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කාලානුරූපව බඩු මිලදී ගැනීමට ගැටළු තිබෙන බවත්, අඩුපාඩු තිබෙන කොට්ඨාසද තිබෙන බවත්, නමුත් මෙම තත්ත්වය මත සතුටු විය යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.උදෑසනද විදුලි බල්බ පත්තු වී තිබෙන බවත්, තුලාවලද එසේ විදුලි බල්බ පත් වී ඇති බවට තමා නිරීක්ෂණය කර ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම පත්තු වන බල්බ තිබේනම් අඬුවක් ගෙන ගොස් වයර් කපා දමන ලෙසත්, මීන් පෙර සිටි ගරු සභාපතිවරුන්ද එසේ කල බවත් ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ කැපුවහොත් එකක්වත් අද වන විට ඉතිරි නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

සභාවේ කිසිම කලමනාකාරීත්වයක් නොමැති බව ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

බල ප්‍රදේශයේ විදුලි බල්බ 25,000කට වඩා තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සෝෂාව.....

iii. 2021.09.03 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීම

| තීරණ අංක 23 |
| --- |
| 2021.09.03 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේයෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iv. 2021-09-23 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

| තීරණ අංක 24 |
| --- |
| 2021-09-23 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේයෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

v. -09-202121 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

| තීරණ අංක 25 |
| --- |
| -09-2021 21 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. |

## 05. <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.</u>

i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය- 2021 ජූලි

ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය - 2021 ජූලි

| තීරණ අංක 26 |
| --- |
| 2021 ජූලි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා 2021 ජූලි මස මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. |

**වැටුප් සම්බන්ධයෙන් ප්‍රාස වාර්තාව සංශෝධනය කර තිබෙන බව** ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 27

අංක 462/8-1987-07-14 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් දන්කොටුව උප කාර්යාල බල ප්‍රදේශයේ ප්‍රදේශ කීපයක් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස නම් කර ඇති බැවින් එම ගැසට් පත්‍රය අනුව මින් ඉදිරියට එම ප්‍රදේශ නාගරික සංවර්ධන බල ප්‍රදේශ ලෙස සලකා කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී..

**එය ගිය මස මහා සභාවට ඉදිරිපත් කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

iv. 2021 සැප්තැම්බර් මස වාහන හා යන්ත්‍ර සඳහා ඉන්ධන හා අලුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව මහා සභාව විසින් සලකා බලන ලදී.

06. **<u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>** .

i. ගරු මන්ත්‍රිනි අයි. එච්. නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, බ/කහටවිල තිබෙන සුසාන භූමියේ කිසිඳු සොහොන් බැඳීමක් සිදු නොකරන ලෙසට පන්සලේ ලොකු හාමුදුරුවන් විසින් යෝජනා කර ලිඛිතවද ලබා දී තිබූ බවත්, ඊයේ දිනය වන විට අවමංගල්‍යයක් සිදු වී කහටවිල පන්සලේ හාමුරුවන් සොහොන බැඳීමට අවසරය ඉල්ලා තිබූ බවත් එවිට එයට එකඟ නොවී තිබූ බවත්, නමුත් කෙසේ හෝ VC එකට ගොස් එම තීරණය වෙනස් කර සොහොන බැඳ තිබූ බවත් ප්‍රකාශ කරන ලදී. තමන්ට අද උදෑසන ආරංචි වූ බැවින් ඒ සම්බන්ධව නිරීක්ෂණය කර පැමිණීමට නොහැකි වූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා මෙහිදී පවසා සිටියේ ආදහනාගාර භූමියේද මෙවැනි දේ සිදු වූ බවයි.මේ සම්බන්ධව උප කාර්යාල වල නිලධාරීන් නොදැන අවසරය ලබා දෙන බවත් එවැනි දේ තමන්ද සම්බන්ධ වී නවත්වා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

උපකාර්යාල වල බලයලත් නිලධාරීන්ව මේ සම්බන්ධයෙන් දැනුවත් කල යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ආදහනාගාර මීනි පිටියේද තැන්පත් කිරීමට ඉඩ ලබා නොදෙන බවත් භූමදානය පමණක් සිදු කරන බවත් ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය මෙහිදී පවසා සිටියේ තමන් දන්නා පිරිසකගෙන් සමිතියක් යැයි පවසා යම් මුදලක් ලබා ගෙන තිබූ බවයි. නමුත් මුදල් ලබා ගන්නේ කවුරුන්දැයි නොදන්නා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සභාවේ තිබෙන සම්පත් අනාගතයටද යොදා ගත යුතු බවත් එම සුසාන භූමිය කුඩා බවත් උප කාර්යාල වලට වගකීමක් තිබිය යුතු බවත්, පන්සලේ හාමුදුරුවන්ගෙන් හෝ දායක සභාවෙන් හෝ ග්‍රාම නිලධාරීගෙන් හෝ කොට්ඨාස මන්ත්‍රීවරයාගෙන් ඒ පිළිබඳව විමසා සිටිය යුතු බවත් ගරු මන්ත්‍රිනි අයි. එච්. නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.මෙය විශාල ගැටළුවක් බවත්, එම මැරුණු පුද්ගලයාගේ පුතා ස්වාමින් වහන්සේ නමක් බවත් ඒ අනුව කෙසේ හෝ මෙම කටයුතු සිදු කරගෙන ඇති බවත් මේ වන විට ජනතාව තමන්ටද එසේ ලබාදෙන්නේ දැයි විමසන බවත් ප්‍රකාශ කරන ලදී. සමස්ථයක් ලෙස ගෙන ඇති තීන්දුව බිඳ දැමුවහොත් ඉදිරියටත් එලෙස අවසර දීමට සිදු වන බවත් ලොකු හාමුදුරුවන් ඊයේ දිනය වන තෙක් තීරණය රැකගෙන පැමිණි බවත් නමුත් කවුරුන් හෝ හාමුදුරුවන්ටද ඉහළින් ගොස් අවසරය ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව බලයලත් නිලධාරීන් ලිපියක් මඟින් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

රටට සේවයක් කල අත්‍යවශ්‍ය කෙනෙකු මියැදුනහොත් සාකච්ඡා කර තීරණයක් ගත හැකි බවත් නැතිනම් ඉදිරියේදී මිහිදන් කිරීමට තවත් ඉඩම් සෙවීමට සිදු වන බවත් ගරු මන්ත්‍රිනි අයි. එච්. නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.ගෙන ඇති තීන්දු තීරණ බිඳී යාමේදී ජනතාව කෙලින්ම මන්ත්‍රීවරුන්ට හා සභාවට ඇඟිල්ල දික් කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ii.ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමා, ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය 04 වන දින වසර 96ක ආයු වැළඳු තම ආදරණීය පියාණන් අභාවප්‍රාප්ත වූ බවත්, පසුගිය ඔක්තෝම්බර් 01 වන දින එතුමා 97 වන වියට පැ තැබූ බවත් ප්‍රකාශ කරන ලදී. වසර 04ක පමණ කාලයක සිට එතුමා යම් රෝගාතුර තත්ත්වයක පසු වූ බවත්, ඊට වසර 08කට පමණ පෙර තම සදාදරණීය මෑණියන්ද මිය පරලොව යාමට යෙදුණ බවත් ප්‍රකාශ කරන ලදී. අද දින මෙම සභාව නියෝජනය කිරීමට 1991 වර්ෂයේදී එනම් හිටපු ගරු සභාපති ශ්‍රීලාල් ප්‍රනාන්දු මහතාගේ කාල වකවාණුවේදී තමන් පැමිණි බවත් ප්‍රකාශ කරන ලදී. එම මැතිවරණ දින තමාට තවමත් සිහිපත් වන බවත් තම පියාණන් මෙම ස්ථානයට තමාව එවීමට දැරූ උත්සාහය හා අවසන් මොහොත දක්වාම එතුමා එම කටයුත්තේම නියැලී සිටි බවත් ප්‍රකාශ කරන ලදී.

තම පියාණන් 1951 වර්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක සාමාජිකයෙකු බවත්, මියයන තුරුම තම දේශපාලන මතය තුළ එතුමා සිටි බවත් එම කරුණු නිසාවෙන්ම හැටපහ දශකයේදී දේශපාලන හේතූන් මත තම පියාණන් සතු වූ නිවස, වෙළඳසැල යන සියල්ලම අහිමි වී ගිය බවත්කිසිවෙකුට ඇඟිල්ලක් දික් කර පැවසූවා නොව එවැනි දුක, සැප,සතුට තම පියාණන් භුක්තිවිඳි කෙනෙකු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.වසර ගණනාවක් එතුමා විවාහ උප්පැන්න මරණ රෙජිස්ටාර්වරයෙකු ලෙසත්, ව්‍යාපාරිකයෙකු ලෙසත් විහාරස්ථානයේ ප්‍රභල කටයුතු වලට දායකත්වය දුන් පුරවැසියෙකු ලෙසත් එතුමා ජීවත් වූ බවත් ප්‍රකාශ කරන ලදී. එතුමා සියළු දෙනාගේම ගෞරවාදරයට පත් වූ බවත් වසර 30ක කාලයක් මෙම සභාව නියෝජනය කිරීමට තම මව හා පියාණන් ලබාදුන් ශක්තිය සැබැවින්ම භාග්‍යයක් බවත් දෙමාපියන් දුන් වපසැරිය අදටත් තමන් ගෙන යන බවත් ඒ තුළ ඥාති පරපුරද සමඟ තමන් සියළුම දෙනා සමඟ සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

එම අවමංගල්‍යය උත්සවය පවත්නා කාලය තුළ එය ගෞරවාන්විතව අවසන් කර ගැනීමට ලබාදුන් ශක්තියට තම පවුලේ සියළුම දෙනා වෙනුවෙන් ගරු සභාපතිතුමාට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්තූතිය පුද කරන ලදී. එමෙන්ම එම පණිඩ්ඩය දැනගත් මොහොතේ පටන් ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා සහ ගරු මන්ත්රී ජී.කේ .අශේන් විමුක්ති ප්රනාන්දු මහතාද නිරන්තරයෙන් තම නිවසේ රැඳී

සිටිමින් තම කටයුත්තට උපරිම සහයෝගය ලබා දුන් බවත්, එමෙන්ම තම වගකීම කරට ගෙන අවමංගල්‍යය උත්සවය පැවැත්වීමට අවශ්‍ය පසුතලය තමාට සකසා දුන් බවත්, එමෙන්ම සියළුම ගරු මන්ත්‍රීවරුන්ද එම අවමංගල්‍යය උත්සවයට පැමිණ අවසන් ගෞරව දැක්වූ බවත්, සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.යම් හෙයකින් දැනුම් දීමක් කිරීමට නොහැකි වූවානම් ඒ වෙනුවෙන් සමාව හජනය කරන බවද ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ලේකම්මහතා ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයටද ස්තූතිය පුද කරන ලදී.

එමෙන්ම ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාටද, පලාත් සභා ගරු මන්ත්‍රී දෙපල වන ට්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමා සහ සන්ද්‍යා රාජපක්ෂ මැතිතුමාටද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මැතිතුමාටද, හිටපු ගරු මන්ත්‍රී ධර්මසිරි ඇරැව්ගොඩ මහතාටද, ගරු මන්ත්‍රී චිත්‍රාල් ප්‍රනාන්දු මහතාටද ඊට අමතරව හාහිර පලාත් නියෝජනය කල පාර්ලිමේන්තු මැති ඇමතිවරු සියළුම දෙනාටද තම පවුල වෙනුවෙන් ස්තූතිවන්ත වන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. තමාට අවශ්‍ය සියළු සම්පත් තම දෙමාපියන්ගෙන් ලද දායාද බවත් තමන් එය ආඩම්බරයෙන් යුතුව පවසන බවත්, තම මවද විදුහල්පතිණියක් ලෙස විශ්‍රාම ගෙන මිය පරලොව ගිය බවත්, පියා විවාහ උප්පැන්න මරණ රෙජිස්ටාර්වරයෙකු ලෙස වෘත්තීය තනතුරක් දරා මිය පරලොව ගිය බවත් එබැවින් ඒ සියල්ලම තමාට ඉවහල් වූ බවට තමන් විශ්වාස කරන බවද ප්‍රකාශ කරන ලදී. තමන් සමඟ දුක බෙදා ගැනීමට පැමිණි සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතියද පුද කරමින් අඩුපාඩුවක් වූවානම් සමාවද අයදිමින් තම කතාව අවසන් කරන ලදී.

❖ ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව වසර 96 ආයු වළඳා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ පියාණන් වූ ගුණසේකර අභයවික්‍රම මැතිතුමන් අප අතරින් සමුගත් බවත්, හොඳ ගසකින් හොඳ ඵලයකුත් නරක ගසකින් නරක ඵලයකුත් ලැබෙන්නාක් මෙන් හොඳ ඵලයක් ලෙස වසර ගණනාවක් දේශපාලක ක්ෂේත්‍රයේ නියැලුණු ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාව වෙන්නප්පුව ආසනයට ලැබුණු බවත්, ගුණසේකර අභයවික්‍රම මහතාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා තුළින් දුටු බවත් ප්‍රකාශ කරන ලදී. ගුණසේකර අභයවික්‍රම මහතා විවාහ උප්පැන්න මරණ රෙජිස්ටාර්වරයෙකු ලෙස මෙම ප්‍රදේශයේ ජනතාවට සුවිශාල මෙහෙවරක් කල උතුම් ගුණාංග වලින් පිරිපුන් පුද්ගලයෙකු බව අසා ඇති බවත් එම පියාණන් ඉපැයූ දේ මෙතුමා සමාජයට කල සේවාව තව තවත් වැඩි කිරීමට හේතු වූ බවත්, වසර 96 මේ ලෝකයේ භුක්ති විඳීමම පිනක් බවත් එම පින ගුණසේකර අභයවික්‍රම මහතාට හිමි වූ බවත් එතුමා කල පිං බලයේ මහිමය ගරු මන්ත්‍රීතුමාට ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ගුණසේකර අභයවික්‍රම මහතාගේ ගුණ කථන කීපයකටම තමන්ට සවස් දීමට හැකි වූ බවත් ඒ තුළින් නොදැකපු නොඇසූ දේ ඇසීමට හැකි වූ බවත් පියාණන් නැතිව ගිය පසුව දැනෙන දුක පියෙකු නැති වීගිය පසුව දැනෙන බවත්, එබැවින් එතුමන් සමඟ ශෝකය බෙදා ගැනීමට මන්ත්‍රීවරුන් සහභාගී වූ බවත් විශේෂයෙන් ගරු සභාපතිතුමා උපසභාපතිතුමා සමඟ එකතු වී සුවිශාල කාර්යය භාරයක්කල බවත්, නමුත් අවසාන අවමංගල්‍යය උත්සවයට අප සියළු මන්ත්‍රීවරුන්ට සහභාගී වීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. ඉදිරියේදී අවසන් උත්සවයට සහභාගී වීමට සියළු දෙනාම උත්සාහ කරමුයැයිද ප්‍රකාශ කරන ලදී. ගුණසේකර අභයවික්‍රම මැතිතුමන් ජීවත් වී සිටියදී එතුමා ඇදහූ ආගම අනුව එතුමාට නිවන් සුව අත්වේවායැයි ප්‍රාර්ථනා කරමින්ද මෙම ශෝක පණිවිඩය ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාට සහ එම පවුල් ඥාතීන් වෙත යැවීමට කටයුතු කරන ලෙසද පවසමින් තම කතාව අවසන් කරන ලදී.

❖ ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ පවුල තම පවුලට ඉතාම සම්බන්ධ පවුලක් බවත් ඇත්තෙන්ම ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා එතුමාගේ පියාව රැකබලා ගැනිම තුළින් එතුමාට පිං අත්වන බවත් ප්‍රකාශ කරන ලදී. වසර 96 ආයු වැළඳූ ගුණසේකර අභයවික්‍රම මැතිතුමාට එම පින තිබුණද එම පිනට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ශක්තියක් එකතු කල බවත්, සභාවේ රැස්වීමක් තිබියදීද පියාට ආහාර පාන ලබා

දීමට පියාට උපස්ථාන කිරීමට එතුමා කඩිමුඩිය යන බවත් මෙය බොරු සුදු හුණු ගෑමක් නොව දෙමාපියන්ට සැලකීමේ උතුම් ගුණාංගය එම පවුල තුළින් තමන් දුටු බවත් ප්‍රකාශ කරන ලදී. තම ආදරණීය මෑණියන්ව හා ආදරණීය පියාණන්ව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා රැකබලා ගත් බවත් එම දරුවන්ටද එම වැඩිහිටියන්ට සැලකීමට පුරුදු කර තිබූ බවත් එම පවුල තුළින් තමන් ලබාගත් ආදර්ශ බොහොමයක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. තම දෙමාපියන්ට හොඳින් සැලකූ නිසා දුක්විය යුතු කාරනාවක් නොවන බවත් මෙය කාටත් පොදු බවත් තම දෙමාපියන්ගේ ශක්තිය හා පිං බලයේ මහිමයෙන් සියළු දෙනාම මෙතැන සිටින බවත් ප්‍රකාශ කරන ලදී. තම දරුවන්ටත් සමාජයටත් එම ගුණාංගය ඉදිරියට ගෙන යාමට ආදර්ශයක් වෙමුයැයි ද පවසමින් ගුණසේකර අභයවික්‍රම මැතිතුමා ශක්තියක් වූවා ලෙසම වසර 96 එතුමාට ආයු වැළඳීමට ශක්තිය ධෛර්යය ලබා දුන් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාට ඒ සඳහා පිං ලබා දෙමින්ද තම කතාව අවසන් කරන ලදී.

❖ ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ලබා ගැනීමෙන් පසුව වත්මන් ප්‍රාදේශීය සභාවේ ජ්‍යේෂ්ඨතම මන්ත්‍රීවරුන් දෙපල වන තමන් හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා 1991 වර්ෂයේදී හඳුනාගත් බව සභා ශාලාවේ තිබෙන රූපරාමු වල දෙදෙනාම සිටින බවත් ප්‍රකාශ කරන ලදී. මේ ලෝකයේ කාටත් පොදු දේ මරණය බවත් එය කාටත් ස්ථිර බවත් ප්‍රකාශ කරන ලදී. වසර 96 ආයු වළඳාලෝකය පිළිබඳ හොඳ දැනුමක් ලබා ලෝකයේ ඉදිරියට යාමට දූවා දරුවන් ලබා දී අවසන් මොහොත දක්වාම සිහි කල්පනාවෙන් සිට මිය පරලොව ගිය ගුණසේකර අභයවික්‍රම මහතාගේ අභාවය පිළිබඳව තමන් රාත්‍රියේ දැනගත් බවත් ප්‍රකාශ කරන ලදී. වෛද්‍ය උපදෙස් මත අවසන් උත්සවය සඳහා තමන්ට සහභාගී වීමට නොහැකි වුවද කර්මාන්ත කමිටුවේ ගරු සභාපතිතුමන් පැවසූ දෙය තමන්ද පිළිගන්නා බවත්, ගරු මන්ත්‍රීවරයෙකුගේ අවමංගල්‍යයක් සිදු වූ විට අවසන් උත්සවයට සහභාගී වීම වටිනා බවත් ප්‍රකාශ කරන ලදී. යහපත් ගුණාංග වලින් හෙබි යුවලකගේ පුත්‍රයෙකු ලෙස ප්‍රාදේශීය සභාවට පත් වූ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා අද දෙමාපියන් පාරේ දමා යන සමාජයක මෙවැනි කාර්යබහුල පුද්ගලයෙකු ලෙස තම පියාගේ මූලික අවශ්‍යතා සපුරාලීමට කටයුතු කල බවත් තමාටද යම් අවස්ථාවල ඒ සඳහා යාමට ඇති බව පවසා ඇති බවත් මෙවැනි දරුවන් අද සමාජයේ අඩු බවත් ප්‍රකාශ කරන ලදී. එම දෙමාපිය දෙපල ගමේ කවුරුත් පිළිගත් දෙපලක් බවත් මෙතුමාගේ මව නියම ගුරු මාතාවක් බවට තමාට ප්‍රාදේශීය සභාවේ හිටපු උපසභාපති, පලාත් සභාවේ හිටපු මන්ත්‍රී දර්මසිරි ඇරැව්ගොඩ මහතාද පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී. දෙමාපියන්ට ගරු කරන දෙමාපියන්ට සලකන දරුවන් බිහි විය යුතු බවත්, මනුෂ්‍යයෙකුට හොඳ නරක දෙකම තිබෙන බවත් අප නිතරම හොඳ දේ පමණක් පැවසිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ගුණසේකර අභයවික්‍රම මහතාට නිවන් සැප අත්වේවායි ප්‍රාර්ථනා කරමින්ද නිතරම අවමංගල්‍යය උත්සවයක අවසන් මොහොතට සහභාගී වීමට උත්සාහ කරමුයැයිද පවසමින් තම කතාව අවසන් කරන ලදී.

❖ ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම අවස්ථාවේදී ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ පියාණන් වන ගුණසේකර අභයවික්‍රම මැතිතුමාගේ මරණය සම්බන්ධයෙන්තමාගේ හා තම පවුලේ ශෝකය ප්‍රකාශ කරන බව පවසා සිටින ලදී. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා තම පියාණන් සමඟ සම්බන්ධ වී කටයුතු කල බවත්, එම අවස්ථාවේදී එතුමාගේ පියා වන ගුණසේකර අභයවික්‍රම මහතා එම කටයුතු වලට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාව
දායක කිරීමට විශාල ශක්තියක් වූ බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා විවාහ උප්පැන්න මරණ රෙජිස්ටාර්වරයෙකු ලෙස මෙම ප්‍රදේශයට විශාල වැඩ කොටසක් කල පුද්ගලයෙකු බවත්, එමෙන්ම ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ මවද මෙම ප්‍රදේශයට විශාල සේවාවක් කල බවත් මෙම ප්‍රදේශයේ ආදර්ශමත් දෙමාපියන් වශයෙන් තම දරු මුණුබුරන් මෙහෙයවා ආදර්ශයක් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා පසුගිය කාලයේ පියාට සලකන්නේ කෙසේද යන්න ආදර්ශයක් ලබා දුන් බවත් ඒ තුළින් ගරු මන්ත්‍රීතුමාට පිනක් ලැබුණ බවත්,සෑම අවස්ථාවකදීම පියාව පළමු ස්ථානය ලබාදෙමින් එතුමාගේ කටයුතු කල බවත්, මේ ආකාරයෙන් කටයුතු කර සියළුම දෙනාට ආදර්ශයක් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සේවාව සිදු කිරීමට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාට අවශ්‍ය වටපිටාව එතුමා සකසා දී ඇති බවත් ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරයෙකු ලෙස දෙමාපිය

ආදර්ශය හා මෙහෙයවීම මත ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ගුරුහරුකම් ලබාදෙමින් ආදර්ශයක් වෙමින් කටයුතු කරන බවත් පවසමින් ගුණසේකර අභයවික්‍රම මහතාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින්ද තම කතාව අවසන් කරන ලදී

- ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා සියළුම දෙනාට ස්තූතිය පල කරන ලදී. මින් පෙරදී කිරීමට තිබූ ශෝක පණිඩ්ඩයක් තිබෙන බවත්, ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියගේ පියාණන් පසුගිය දින කොවිඩ් රෝගයෙන් මිය පරලොව යන්නට යෙදුන බවත්, තම විෂය පථයටඅදාල නිලධාරීතුමිය එතුමිය බවත්, සියළුම දෙනා මෙම රෝගයට ගොදුරු වී සිටි අවස්ථාවේ එතුමියගේ පවුලේ සාමාජිකයින්ද එම රෝගය වැළදී සිටි බවත් ප්‍රකාශ කරන ලදී. මාරවිල රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව එතුමියගේ පියාණන් අභාවප්‍රාප්ත වූ බවත් එම මරණයක් සමග අවශ්‍ය කටයුුත සලසා දෙමින් එම කටයුතු ඉෂ්ඨ සිද්ධ කරදීමට අවශ්‍ය කටයුතු සිදු කල බවත්, විශේෂයෙන්ම කමිටුවේ සභාපතිතුමා ලෙසත්, කමිටුව ලෙසත් සභාවේ නිලධාරීතුමියක් වන ඇයට ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම කිරිමැටියාන මහජන පුස්තකාලයේ පාඨක සමාජයේ සභාපතිතුමා වූ බන්දුල රාලහාමි මහතාද පසුගිය දිනක කොවිඩ් රෝගය වැළදී මියපරලොව ගිය බවත්, එතුමාද කිරිමැටියාන ප්‍රදේශයේ පවුල් සංස්ථාවක් නියෝජනය කල සමාජයට සේවාවක් කල ජේෂ්ඨ පුරවැසියෙකු බවත් එබැවින් මෙම ශෝක පණිඩ්ඩ දෙකම ලිඛිතව ඔවුන්ට ලැබීමට සලස්වන ලෙසද ඉල්ලමින් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා තම කතාව අවසන් කරන ලදී

එමෙන්ම සභාවේ සේවය කරන සුනිල් ජයවර්ධන මහතාගේ නැන්දණියද කොවිඩ් රෝගයෙන් පසුගිය දින මියපරලොව ගිය බවත් ඇයටත් නිවන් සුව ප්‍රාර්ථනා කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.